ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1656/30 – 2010 ජූනි 03 වැනි බ්‍රහස්පතින්දා – 2010.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: වැලි/2/3/27/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපලාත කෝරළයේ අගම්පොඩිගම (වැලිමඩ නගර සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක අ.ග.පි. 58 පත්‍රය 7, අතිරේකය 15 හා 2010.05.11 දිනැති අවසාන ගම් පිඹුරේ කැබලි අංක 57, 58, 60, 61, 67 යනුවෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0928 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි පහ (5).

කැබලි අංක 57
ඉඩමේ නම: උඩදෙමෝදරවත්ත; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: 0.0004.

කැබලි අංක 58
ඉඩමේ නම: උඩදෙමෝදරවත්ත; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: 0.0012.

කැබලි අංක 60
ඉඩමේ නම: දමුනුගහකුඹුර; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: 0.0026.

කැබලි අංක 61
ඉඩමේ නම: දමුනුගහකුඹුර; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදන; ප්‍රමාණය: 0.0382.

කැබලි අංක 67
ඉඩමේ නම: නොදනී; විස්තරය: මාර්ගය (මා.සං.අ.); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: 0.0504.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 ජූනි මස 22 වැනි දින පෙ.ව. 11.00 ට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 ජූනි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2010 මැයි මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වැලිමඩ.

06 - 332